## ශ්‍රම පදනම මත ටිංකර්කරු, වාහන පිංතාරුකරු, වඩු කාර්මික, විදුලි කම්බිකරු, විදුලි කම්බිකරු සහායක, අර්ධ පුහුණු කම්කරු සහ නුපුහුණු කම්කරු තනතුර සඳහා මාස 06 ක කාලසීමාවකට ශ්‍රම මිලදී ගැනීම පදනම මත සේවය ලබා ගැනීම.

## මහා නගර සභාව - මීගමුව.

මීගමුව මහා නගර සභාවේ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවට වාහන ටිංකර් කිරීම සඳහා ටිංකර්කරු තනතුරට, වාහන පිංතාරු කිරීම සඳහා වාහන පිංතාරුකරු තනතුරට , සියලුම වඩු වැඩ සිදු කිරීම සඳහා වඩුකාර්මික තනතුරට, විදුලි රැහැන් ඇදීම, වීථි ලාම්පු සවි කිරීම සඳහා විදුලි කම්බිකරු තනතුරට හා විදුලි රැහන් ඇදීම, වීථි ලාම්පු සවි කිරීම සහාය වීම සඳහා විදුලි කම්බිකරු සහායක තනතුර සහ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි, බෝක්කු හා කාණු නඩත්තු කටයුතු ඉටු කිරීම හා සහාය වීම සඳහා අර්ධ පුහුණු කම්කරු සහ නුපුහුණු කම්කරු තනතුරු සඳහා සහාය වීමට ශ්‍රම මිලදී ගැනීම යටතේ මාස 06ක කාලසීමාවකට සේවා අවශ්‍යතාවය පවතින දින වලදී සේවය ලබා ගැනීම සඳහා පහත කොන්දේසි යටතේ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

<u>**තනතුරට අදාල කොන්දේසි**</u>

**ටිංකර්කරු, වාහන පිංතාරුකරු, වඩු කාර්මික විදුලි කම්බිකරු තනතුර**

- අධ්‍යාපන සුදුසුකම් - අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගනනකදී යටත් පිරිසෙන් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වීම තිබීම.
  (මින් විෂයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය.)

  අ.පො.ස (සා.පෙළ) සමතුන් නොමැති නම් NVQ 03 මට්ටම ලබා තිබීම.

- වෘත්තීය සුදුසුකම් - අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හී (N.V.Q) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම හා අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.
  (සහතික මගින් සනාථ කල යුතුය.)

<u>**අර්ධ පුහුණු කම්කරු තනතුර**</u>

- අධ්‍යාපන සුදුසුකම් - අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගනනකදී යටත් පිරිසෙන් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වීම තිබීම.
  (මින් විෂයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය.)

- පළපුරුද්ද - ගොඩනැගිලි, බෝක්කු හා කාණු නඩත්තු ඉටු කිරීම සම්බන්ධව මාස 06 ක පලපුරුද්ද සහතික මගින් ඉදිරිපත් කල යුතුය.

**විදුලි කම්බිකරු සහායක**

- අධ්‍යාපන සුදුසුකම් - අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගනනකදී යටත් පිරිසෙන් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වීම තිබීම. (මින් විෂයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය.)

- පළපුරුද්ද - විදුලි රැහැන් ඇදීම, වීදි ලාම්පු සවි කිරීම සහාය වීම සම්බන්ධව මාස 06 ක පලපුරුද්ද සහතික මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලබේ.

**නුපුහුණු කම්කරු**

- අධ්‍යාපන සුදුසුකම් - අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගනනකදී යටත් පිරිසෙන් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වීම තිබීම. (මින් විෂයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය.)

- පළපුරුද්ද - ගොඩනැගිලි, බෝක්කු හා කාණු නඩත්තු කටයුතු සඳහා සහාය වීම සම්බන්ධව මාස 06 ක පලපුරුද්ද සහතික මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලබේ.

**තනතුරු සියල්ලටම අදාල පොදු කොන්දේසි.**

- කායික සුදුසුකම් - තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් පිලිබඳව රජයේ රෝහලකින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් සනාථ කළ යුතුය.

- වෙනත් -
  - i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
  - ii. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
  - iii. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. (මීගමුව මහා නගර සභා බල ප්‍රදේශය තුල පදිංචි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. ග්‍රාම නිලධාරී සහතිකයක් මගින් පදිංචිය සනාථ කල යුතුය.)
  - iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
  - v. අයදුම්කරු අපරාධ ක්‍රියාවන්ට සම්බන්ධ වී නොමැති බව සනාථ කිරීමට, පදිංචියට අදාල පොලිස් ස්ථානයෙන් නිකුත් කල පොලිස් සහතිකයක් ඉදිරිපත් කල යුතුය.

- වයස
  - අවම සීමාව - අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතුය.
  - උපරිම සීමාව - අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

- වාහන පිංතාරුකරු - වාහන පිංතාරු කිරීමට පෙර සිදු කරන කාර්යන් වන මතු පිට මට්ටම් කිරීම, තීන්ත වර්ග හඳුනාගෙන අවශ්‍ය වට්ටෝරු අනුව, තාක්ෂණික ක්‍රම උපයෝගි කර ගනිමින් පින්තාරු කිරීමේ හැකියාවක් පැවතිය යුතුය.

- වඩු කාර්මික - දැව භාවිතයෙන් ගොඩනැගිලි, වහල, සීලිම, තරප්පු, උළු අහු, දොර ජනෙල් හා ගොඩනැගිලි ඉදි කිරීමේදී දැව භාවිතයෙන් ගොඩ නඟන කොටස් හා ගෘහ භාණ්ඩ, දැවමය උපකරණ, වාහන කොටස් ලොරි බොඩි ගැසීම ආදී ශිල්පීය දැනුම භාවිතයෙන් ඉටු කරන දැවමය ඉදිකිරීම් කටයුතු ඉටු කිරීමට හැකියාවක් පැවතිය යුතුය.

- ටිංකර්කරු - තාක්ෂණික දැනුම උපයෝගි කර ගෙන ඉංජිනේරුමය ඉදිකිරීම් සඳහා හෝ ලෝහ තහඩු මගින් නිපදවනු ලබන භාණ්ඩ හෝ උපකරණ හෝ උපාංග සකස් කිරීම, අවශ්‍ය උපකරණ නඩත්තුව.

- විදුලි කම්බිකරු සහායක - විදුලි රැහැන් ඇදීම, වීජී ලාම්පු සවි කිරීම සහාය වීම.

- අර්ධ පුහුණු කම්කරු - ගොඩනැගිලි, බෝක්කු හා කාණු නඩත්තු කටයුතු ඉටු කිරීම.

- නුපුහුණු කම්කරු - ගොඩනැගිලි, බෝක්කු හා කාණු නඩත්තු කටයුතු ඉටු කිරීමට සහාය වීම.

- ටිංකර්කරු, වාහන පිංතාරුකරු, වඩු කාර්මික, විදුලි කම්බිකරු තනතුරු සඳහා වැඩ කරන දිනකට රු 4000.00 දීමනාවක් ද විදුලි කම්බිකරු සහායකයින්, අර්ධ පුහුණු කම්කරු සඳහා වැඩ කරන දිනකට රු 3200.00 දීමනාවක් ද නුපුහුණු කම්කරු සඳහා රු 3000.00 ගෙවනු ලැබේ.

- මීගමුව මහා නගර සභාව නියම කරනු ලබන දින වලදී ඔබගේ සේවය ලබාදිය යුතු අතර, පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා (කෑම වේලාව ද ඇතුළුව) සේවයේ යෙදිය යුතුය.

- සම්මුඛ පරීක්ෂණයකට ලක්කර සුදුසු අය තෝරා ගනු ලැබේ.

- සේවය ලබා ගැනීමට ඔබව තෝරා ගතහොත් ඔබ මීගමුව මහා නගර සභාව සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

- ඔබ විසින් සකස් කරන ලද අයදුම්පතක් 2026.04.25 දිනට පෙර ලැබෙන පරිදි **"නාගරික කොමසාරිස්, මහා නගර සභාව, තෙල්වත්ත හන්දිය, කොළඹ පාර, මීගමුව"** යන ලිපිනයට තැපැල් මගින් හෝ සතියේ වැඩ කරන දින වල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා නාගරික කොමසාරිස් කාර්යාලය වෙත ගෙනවිත් භාරදිය හැක.

නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
මීගමුව.
2026.04.07